**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2013**

---------------------------------------------

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

ජීවන වියදම්වලට අදාළ හිඟ අර්ථසාධක අරමුදල් දායකය ප්‍රතිලාභීන්ට බැර කිරීම සඳහා 2012 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මිලියන 500 කින් රු. මිලියන 153.3 ක් හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු නොකර ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

#### 2.2.2. ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල විසින් මෙහෙයවා තිබූ අර්ථසාධක අරමුදලේ දායක මුදල් අර්ථසාධක අරමුදලට පැවරීමේදී නිශ්චිතව හඳුනා නොගත් ශේෂ පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් හඳුනාගත නොහැකි ශේෂවල වටිනාකම රු. 6,903,570 ක් විය. මෙම ශේෂ හඳුනා ගැනීමට කටයුතු නොකර ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත ගිණුමට මාරුකර තිබුණි.

(ආ) සේවය අවසන් කළ සාමාජිකයන් වෙත නිකුත් කරන ලද රු.19,400,886 ක් වටිනා චෙක්පත් අවලංගු කර වර්ෂ 02 සිට වර්ෂ 12 දක්වා කාල පරාසයක් ගතවී ඇතත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට රු.23,457,619,698 ක් වූ සේවක අර්ථසාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරීත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලිය සකස් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් මුදල ලැබූ බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත්, නියැදි පරීක්ෂවාට අනුව එකතුව රු.69,796,055 ක් වූ වවුචර් පත් 16 ක අදාළ කුවිතාන්සි මඟින් ගෙවීම් තහවුරු කරවා ගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ශුද්ධ ආදායම රු. 2,261,004,172 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ආදායම රු.1,610,810,538 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.650,193,634 ක වර්ධනය සඳහා ආයෝජන ආදායම රු.703,592,684 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සැලසුම්ගත කාර්යයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉදිරිපත් කර ඇති අතර 2011 / 2012 ක්‍රියාකාරී සැලැස්ම අනුව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිගේ අවධානය යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) නියමාවලිය සැකසීම.
(ආ) දායක මුදල් එකතු කිරීම හා පොළී ගණනය කිරීම.
(ඇ) අරමුදලට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.
(ඈ) සාමාජික අරමුදල් නිදහස් කිරීම.